සැ. යු.-2008.12.11 දින පළ කරන ලද අංක 1,580 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,581 - 2008 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2008.12.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1688 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1689 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 දෙසැම්බර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 දෙසැම්බර් මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ පුරප්පාඩු වී ඇති මුල් ළමාවිය සංවර්ධන සහකාර තනතුරු පුරප්පාඩු පිරවීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

01. *සාමාන්‍ය සුදුසුකම්*

වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්*

අධ්‍යාපන විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයකින් විශේෂවේදී උපාධියක් ලබා තිබිය යුතුය.

03. වැටුප් බණ්ඩය හා වැටුප් පරිමාණය MN 4- 2006 A රු. 15,215 - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - 25,965

04. *බඳවා ගැනීමේ ක්‍රමය*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් ඇති අයවළුන් තෝරා ගනු ලැබේ.

05. *බඳවා ගැනීමේ කොන්දේසි*

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම ලැබූ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.

(ආ) තෝරා ගනු ලබන අයැදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ සහ මින්මතු පනවනු ලබන්නා වූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. එමෙන්ම ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රජය මඟින් දැනට නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත් විය යුතුය. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති අදාළ වේ.

(ඇ) තෝරා ගනු ලබන අයැදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට යෝග්‍ය ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වූවන් විය යුතු අතර. රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ඈ) තනතුරට පත් වී වසර තුනක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

06. අයැදුම් කළ යුතු ආකාරය

(අ) මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තෙහි සකස් කරන ලද අයැදුම්පත් 2009.01.16 දිනට පෙර ලේකම්, ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයවළුන් අයැදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුවේ. අයැදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස කෙළවරේ "මුල් ළමාවිය සංවර්ධන සහකාර තනතුරු සඳහා අයැදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ආ) සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයැදුම්පත්‍ර ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

(ඇ) තැපෑලේදී ප්‍රමාදවන හෝ අස්ථානගත වන අයැදුම්පත්‍ර සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ වගකීමක් නොමැති බවද සැලකිය යුතුවේ.

07. *සාවද්‍ය තොරතුරු සැපයීම*

යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු ඒ බව දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

08. අයැදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධව පැන නගින ගැටලු සම්බන්ධයෙන් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

එම්. සුමනදාස,
ලේකම්.

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය,
අංක 177. නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05.

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

**ආදර්ශ අයැදුම්පත්‍රය**

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය
මුල් ළමාවිය සංවර්ධන සහකාර තනතුර සඳහා අයැදුම් කිරීම

01. (අ) අයැදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)
අයැදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසියෙන්)

(ආ) සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)
සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසියෙන්)

02. ස්ථිර ලිපිනය :———.

03. දැනට පදිංචි ලිපිනය :———.

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :———.

07. උපන්දිනය : වර්ෂය :——. මාසය :——. දිනය :——.

08. ජාතිය :———.

09. විවාහක/අවිවාහක බව :————.

10. ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :————.

(i) විශ්වවිද්‍යාලය :————.

(ii) උපාධිය පිරිනැමූ දිනය :————.

(iii) ලබා ඇති උපාධිය :————.

(iv) පන්තිය :————.

(v) භාෂා මාධ්‍යය :————.

11. අදාළ වන වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා)

i. ————,

ii. ————,

iii. ————.

12. භාෂා ප්‍රවීණත්වය (අදාළ තීරුවේ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි | | | | |

13. පළපුරුද්ද :————.

**අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ සහතිකය**

........................... වන මා මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————.

අයැදුම්කරු/අයැදුම්කාරියගේ අත්සන

දිනය :————.

**රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.................. මයා/මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ.................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————,

නම :————,

තනතුර :————.

අමාතංශය/දෙපාර්තමේන්තුව :————.

12-499

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2008

*ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය*

01. කතෝලික යොවුන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ලෙස හඳුන්වනු ලබන මෙම විභාගය 2009 මාර්තු මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. විභාග මධ්‍යස්ථානය.-දිවයින තුළ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස අයැදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයැදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව 1 වැනි උපලේඛනයේ දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය* :- මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්* :-මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයැදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 කතෝලික දහම් පාසලක 10 වැනි ශ්‍රේණිය සමත්වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරතවීම

4.2 ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම.

4.3 ඒ ඒ රදගුරුවසම්වල පවත්වන වාර්ෂික ධර්මෝපදේශ විභාගයේ එකොළොස්වැනි වසර සමත්වීම.

සටහන :- i. මෙම විභාගය සඳහා ඉදිරිපත් සෑම අයැදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ මිසම්භාර පූජාප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කළ යුතුය.

ii. විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයැදුම්කරුවකු වශයෙන් පමණකි.

05. අයැදුම් කිරීම

5.1 කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සියලු ම දහම් පාසල්වලට අවශ්‍ය ඉල්ලුම් පත්‍ර සහ උපදෙස් පත්‍රිකා යථා කාලයේදී සපයනු ලැබේ. නියමිත දින වකවානු තුළ ඉල්ලුම් පත්‍ර නොලැබුණොහොත්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයැදුම්කරුවන් සංඛ්‍යාව යන විස්තර සඳහන් ලිපියක් 5.6 ඡේදයේ සඳහන් ලිපිනයට 2009.01.02 වැනි දිනට පෙර දැන්විය යුතුය.

5.2 කවර හෝ අයැදුම්කරුවකුට බාහිර අයැදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වූවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 60ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් වෙත ලබාදෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයැදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස්කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතුය. දෙවැනි පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබාගත යුතුය. අයැදුම්පත්‍ර දෙකෙහි ම ප්‍රධානාචාර්යවරයා අත්සන් තබා තිබිය යුතුය.

5.4 අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2009.01.16 වැනි දින වේ.

5.5 අයැදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයැදුම්පත් සහ අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ ලිපිනය නිවැරදිව සඳහන් කළයුතු අතර ලිපිනය වෙනස්වී නම් එය දැන්විය යුතුය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයැදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයැදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

අයැදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවෙරේ "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය (2008)" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය. කිසිම සහතිකයක් අයැදුම්පත් සමඟ අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.7 අයැදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත් සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත් අයැදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ වගකිව යුතුය.

06. *විභාග ගාස්තු* :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 60 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත්වන අයැදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.

6.1 *විභාග ගාස්තු ගෙවීම* : විදුහල්පතිතුමා විසින් විභාග ගාස්තු ගෙවිය යුතු සියලුම අයැදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතුකොට දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයැදුම් පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම* :-කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. *ප්‍රවේශ පත්‍ර* : විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයැදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයැදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයැදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටීනම් ඔහුගේ හෝ ඇයගේ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයැදුම්කරුගේ අත්සන දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මිසම් භාර පූජාප්‍රසාදිතුමා හෝ සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේ නම :————,
2. දහම් පාසලේ නම :————,
3. සම්පූර්ණ නම සහ ලිපිනය :————,
4. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :————,
5. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————,
6. ලිපිය ලියාපදිංචි කළ අංකය සහ දිනය :————,
7. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත් අංකය, දිනය සහ තැපැල් කාර්යාලය. :————.

08. *හැඳුනුම් පත* : එක් එක් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින සෑම අවස්ථාවක ම ශාලාධිපතිට පිළිගත හැකි පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය :

8.1 ජාතික හැඳුනුම්පත :————,<br>
8.2 වලංගු විදේශ ගමන් පත්‍රය :————.

09. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* :-

මෙම විභාගය සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර හතරක් වන අතර විභාගයෙන් සමත්වීමට සෑම අපේක්ෂකයකුම එකම අවස්ථාවක දී ප්‍රශ්න පත්‍ර (විෂය) හතරෙන් ම සමත්විය යුතුය.

9.1 මෙම විභාගයේ ඌන සාමාර්ථය ප්‍රදානය කරනු නොලැබේ.

9.2 සෑම විෂයකම ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ඨ සම්මාන | D |

9.3 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය* :- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩ දෙනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාගයේ ප්‍රතිඵල නිකුත්වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින් ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථාව සහ විෂය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණ වනු ඇත.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දීය.

## කතෝලික ධර්මය

(2007 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා විෂය නිර්දේශය

මෙම විභාගය පැය 03 බැගින්වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විත ය.

### 1 වන ප්‍රශ්න පත්‍රය

### කතෝලික විශ්වාසය

(අ) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ එන මූලික ඉගැන්වීම් පදනම් වේ.

* මැවුම්කරුවාණෝ
- විශ්වයේ ප්‍රභවය
- මැවිල්ලේ අසිරිය
- මැවිල්ල සුරැකීම (උත්පත්ති 1, 2, 3)

* ගැලවුම්කරුවාණෝ
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ජොහන් 1:1-14)
- දේව රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම් (මතෙවු 5, 6, 7)
- උපමා (මතෙවු 13:1-52)
- ප්‍රාතිහාර්ය (ජොහන් 11:38-45, ලූක් 8:26-39, මාක් 2:1-12, මාක් 4:35-41)

* ශුද්ධාත්මයාණෝ
- ක්‍රියාකාරිත්වය (ජොහන් 7:37-39, 14:15-31, 16:5-15, 1 කොරින්ති 12:4-11)

* කිතුනු සභාව
- ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය සහ අපෝස්තලිකත්වය
- සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස
  - * රෝම 12:4-21
  - * 1 කොරින්ති 12:12-31
- සභාවේ පාලන සැලැස්ම
- නිලබලය ලත් සේවය
- පැවිදි සේවාවන්
- ගිහි සේවාවන්

* රූපාන්තර පරිවර්තනය
- මනුෂ්‍යාගේ අවසාන සිද්ධි
- අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව්ව 21:1-4)

### ii වන ප්‍රශ්න පත්‍රය

### කතෝලික ජීවිත පැවැත්ම

(ආ) කතෝලික ජීවිත පැවැත්මට පත්තරය ලැබෙන ජනවන්දනාව
- * දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත
- * පාස්කු අභිරහස
- * දේව වරප්‍රසාද
- * ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)

ආරම්භ ප්‍රසාද නිධාන
- * ප්‍රසාද ස්නාපනය
- * අභිවෘද්ධි ආලේපය
- * දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

සුවය ලබාගැනීමේ ප්‍රසාද නිධාන
- * සමගි සන්ධානය
- * රෝගීන්ගේ ආලේපය

සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන
- * පූජකවරය
- * ආශිර්වාදකාර බන්ධනය

### III වන ප්‍රශ්න පත්‍රය

### කතෝලික සදාචාරාත්මක ජීවිතය

(ඉ) කතෝලික සදාචාරය

- * දස පනත සහ ප්‍රේමයේ පනතේ පැතිකඩ දෙක
- * දස පනත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ (මතෙව් 5:21-47)
- * තැනිතලා ස්ථානයේ දේශනය (ලූක් 6:17-49)

* බුද්ධිය, නිදහස් කැමැත්ත සහ හැඟීම්
* දේව සම්බන්ධ ධර්ම ගුණ
* හෘද සාක්ෂිය
* දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3පනත්)

අසල්වැසියාට ප්‍රේම කිරීම (4-10 පනත්)
දස පනත තුළින් මතුවිය යුතු සාරධර්ම
කතෝලික අනන්‍යතාව

IV වන ප්‍රශ්න පත්‍රය

යාච්ඤාවේ ජීවිතය

(ඒ) දේව සබඳතා ගොඩ නැඟෙන යාච්ඤාව

* පුරාණ ගිවිසුමේ යාච්ඤාව
  - අබ්‍රහම්
  - මෝසෙස්
* නව ගිවිසුමේ යාච්ඤාව
  - ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
  - යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලුක් 11 : 1-13)
* සභා ජීවිතය තුළ යාච්ඤාව
  - ප්‍රශංසාව
  - ස්තුති පිදීම
  - යැදුම
  - මැදහත් යැදුම
  - භාවනාත්මක යාච්ඤාව
* ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම් හත
  - ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
  - ඔබගේ රාජ්‍යය පැමිණේවා
  - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහි ඉටුවේවා
  - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
  - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව.
  - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදනු මැනව.
  - අයහපතින් අප මුදා ගත මැනව
* විවිධ භක්ති අභ්‍යාස
  - ජපමාලය
  - නුවාන
  - ශුද්ධ පැය

පරිශීලනය කළ යුතු ග්‍රන්ථ

- නව කතෝලික ධර්මෝපදේශය
- මහෝපදේශය
- ශුද්ධ බයිබලය (නියමිත කොටස්)
- ii වන වතිකාන ප්‍රකාශන

* ජනවන්දනාව
* වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව
* ක්‍රිස්තුත් වහන්සේගේ සභාව
* ගිහි ධර්මදූත සේවය

**උපලේඛනය**

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක

දිස්ත්‍රික්කය - 01 කොළඹ

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බොරැල්ල | 0101 |
| කලුඅග්ගල | 0102 |
| පන්නිපිටිය | 0103 |
| මොරටුව | 0104 |

දිස්ත්‍රික්කය - 02 ගම්පහ

| | |
|---|---|
| මීගමුව | 0205 |
| කඳාන | 0206 |
| ගම්පහ | 0207 |
| රාගම | 0208 |

දිස්ත්‍රික්කය - 03 කළුතර

| | |
|---|---|
| කළුතර | 0309 |

දිස්ත්‍රික්කය - 04 ගාල්ල

| | |
|---|---|
| ගාල්ල | 0410 |

දිස්ත්‍රික්කය - 05 මාතර

| | |
|---|---|
| මාතර | 0511 |

දිස්ත්‍රික්කය - 06 හම්බන්තොට

| | |
|---|---|
| හම්බන්තොට | 0612 |

දිස්ත්‍රික්කය - 07 රත්නපුර

| | |
|---|---|
| රත්නපුර | 0713 |

දිස්ත්‍රික්කය - 08 කෑගල්ල

| | |
|---|---|
| කෑගල්ල | 0814 |

දිස්ත්‍රික්කය - 09 පුත්තලම

| | |
|---|---|
| පුත්තලම | 0915 |
| හලාවත | 0916 |
| වෙන්නප්පුව | 0917 |

දිස්ත්‍රික්කය - 10 කුරුණෑගල

| | |
|---|---|
| කුරුණෑගල | 1018 |
| කුලියාපිටිය | 1019 |
| නිකවැරටිය | 1020 |

දිස්ත්‍රික්කය - 11 මහනුවර

| | |
|---|---|
| මහනුවර | 1121 |

| නගරය | නගර අංකය |
|---|---|
| දිස්ත්‍රික්කය - 12 මාතලේ | |
| මාතලේ | 1222 |
| දිස්ත්‍රික්කය - 13 නුවරඑළිය | |
| තලවාකැලේ | 1323 |
| දිස්ත්‍රික්කය - 14 බදුල්ල | |
| බදුල්ල | 1424 |
| දිස්ත්‍රික්කය - 15 මොණරාගල | |
| මොණරාගල | 1525 |
| දිස්ත්‍රික්කය - 16 අනුරාධපුරය | |
| අනුරාධපුරය | 1626 |
| දිස්ත්‍රික්කය - 17 පොළොන්නරුව | |
| හිඟුරක්ගොඩ | 1727 |
| දිස්ත්‍රික්කය - 18 ත්‍රිකුණාමලය | |
| ත්‍රිකුණාමලය | 1828 |
| දිස්ත්‍රික්කය - 19 මඩකලපුව | |
| මඩකලපුව | 1929 |
| දිස්ත්‍රික්කය - 20 අම්පාර | |
| අම්පාර | 2030 |
| කල්මුනේ | 2031 |
| දිස්ත්‍රික්කය - 21 යාපනය | |
| යාපනය | 2132 |
| මානිප්පායි | 2133 |
| පරුත්තිතුරෙ | 2134 |
| නෙඩුන්තීවු | 2135 |
| දිස්ත්‍රික්කය - 22 මුලතිව් | |
| කිලිනොච්චිය | 2236 |
| මුලතිව් | 2237 |
| මුලංගාවිල් | 2238 |
| දිස්ත්‍රික්කය - 23 මන්නාරම | |
| මන්නාරම | 2339 |
| මුරුංගන් | 2340 |
| ආන්ඩාංකුලම් | 2341 |
| පෙරිය පන්ඩිච්චිරිස්සාන් | 2342 |
| දිස්ත්‍රික්කය - 24 වව්නියාව | |
| වව්නියා | 2443 |

12-458

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ඉස්ලාම් ආගමික අහදිය්‍යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය-2008

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි)

*නීති රීති හා ව්‍යවස්ථා :*

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2009 මාර්තු මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ ඇමුණුම් 01හි සඳහන් වේ.

2. විභාග මධ්‍යස්ථාන.- එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02 හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථාන අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. භාෂා මාධ්‍යය.- මෙම විභාගය දෙමළ, සිංහල, ඉංග්‍රීසි ආදී භාෂාවලින් පවත්වනු ලැබේ.

4. සුදුසුකම්.- මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙක්ම මෙහි පහත සඳහන් කර ඇති කරුණු වලින් එකක් අවම වශයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්‍යා දහම් පාසලක 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයකු වීම

*හෝ*

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර්ආන් මද්රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයකු වීම.

*හෝ*

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ ඉස්ලාම්, අරාබි විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අයකු වීම.

*සටහන* - (1) මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්රසාවේ ජ්‍යෙෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති විසින් සහතික කළ යුතු වේ.

(2) සෑම අයදුම්කරුවෙකුම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්‍යා පාසල හෝ ජ්‍යෙෂ්ඨ අල් කුර් ආන් මද්රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

5. ලියාපදිංචි කළ සියළුම අහදිය්‍යා දහම් පාසල් මද්රසා පාසල් වෙත ඉල්ලුම් පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන

හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කල ලිපියක් 2009.01.02 වැනි දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියළුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුවට යැවිය යුතු අතර අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනුකර තැබිය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය 2009 ජනවාරි 16 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ. එසේ සම්පූර්ණ කරනු නොලබන ඉල්ලුම්පත් හා අවසාන දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ.

විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

(ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ)

5.5 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ඉස්ලාම් ආගමික අහදිය්‍යා අවසාන සහතික පත්‍ර විභාගය — 2008" යනුවෙන් හා ඉල්ලුම්කරන විභාග මධ්‍යස්ථානය ද සඳහන් කළ යුතුය.

5.6 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නොවේ. අහදිය්‍යා දහම් පාසලේ හෝ මද්රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බවට සහතික කළ යුතුය.

6. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින අයගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවන වරට පසු පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 60ක් ගෙවිය යුතුය.

*විභාග ගාස්තු ගෙවන ආකාරය.*-නියමිත මුදල තැපැල් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

7. ප්‍රවේශ පත්‍ර - විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත විභාග ප්‍රවේශය නිකුත් කරනු ලැබේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින පළමුවන දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානයට හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත්කළ අවස්ථාවක දී අදාළ අයදුම්කරුගේ විභාග අයදුම්කරුභාවයේ සුදුසුකම අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශපත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති, මද්රසා විදුහල්පති, අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් වඩා 237,060කට වඩා වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියෙකු මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනෙකු විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින හත (7)කට පෙර ප්‍රවේශපත්‍ර නොලැබුනහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයදිය්‍යා පාසල් වල හෝ මද්රසා පාසල් වල විදුහල්පතිවරුන් මේ පිළිබඳව විභාගව කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එවැනි සෑම අවස්ථාවක දී ම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතුය.

(අ) විභාගයේ නම
(ආ) අහදිය්‍යා පාසල්/කුර්ආන් මද්රසා/රජයේ පාසලේ නම
(ඇ) සම්පූර්ණ නම හා ලිපිනය
(ඈ) ඉල්ලුම්කළ විභාග මධ්‍යස්ථානය
(ඉ) ඉල්ලුම්පත්‍රය යැවූ තැපැල් කාර්යාලය
(ඊ) ලියාපදිංචි කළ දිනය හා අංකය

8. *අනන්‍යතාවය තහවුරු කිරීම.*- සියලුම අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින සෑම අවස්ථාවක දී ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන ආකාරයට තමන්ගේ අනන්‍යතාවය ඔප්පුකළ යුතුය.

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම*

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර තුනක් (03) ඇතුළත එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට, එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැකිය. (මෙය 2007 වසරේ සිට බලපැවැත්වේ.)

9.2 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.- විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*- විභාගයෙන් සාමාර්ථය ලබන සියලුම අයදුම්කරුවකුටම සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. *ප්‍රතිඵල නැවත සමීක්ෂණය*- විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයෙකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස් වලට අනුකූලව කටයුතු කිරීමට සියලුම අයදුම්කරුවන් බැඳී සිටින අතර මෙහි සඳහන් නොවූ කරුණු ඇතොත් ඒවා විභාග කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි තීරණය ගනු ලැබේ.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2004 නොවැම්බර් මස 28 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

*ඇමුණුම 01*

විභාග සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශ

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ.

පළමුවන ප්‍රශ්න පත්‍රය :

1. අකීදා සහ ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග)

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියියාත්, අන්නුබුව්වත්, අර්රූහානියත්, අස්සම් ඉය්යාත්)

1.2 අකීදාවේ කොටස් :

* අහුලුස්සුන්න වල්ජමා අත්හි අකීදා
* අනිකුත් අකීදා කොටස් කිහිපයක් ජබරිය්යා, කදිරිය්යා, මුර්ජියා. මුඃතජිලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු :

* ඊමාන් හා කුප්රු
* රිද්දත්, නිපාක්
* අල්කුරාණය පහළ කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
* නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
* සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කල ඉතිහාසය
* නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
* හදිස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දිස්වරුන්ගේ දායකත්වය
* ඉජ්තිහාද් පිළිබඳ විස්තර
* ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
* ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
* පික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව :

* හැඩහුරු සහිතව ලිවීම
* කුඩා වාක්‍යයන් ලිවීම
* ඉස්ලාම් විෂයට අදාළ අරාබි වචන ලිවීම
* ප්‍රධාන සූරා, ආයත්, හදිස් ආදිය නිවැරදිව ලිවීම

දෙවන ප්‍රශ්න පත්‍රය

2. අල්පික්හුල් ඉස්ලාම් නීති පද්ධතිය

2.1 ඉබාදත් පිළිබඳ විස්තර
ඉබාදතයේ කොටස්
තහාරත්

2.2 නජිසය හා එහි කොටස්
නජිසය පිරිසිදු කිරීමේ ක්‍රම
ජලය හා එහි වර්ග
වුදු, තයම්මුම් ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත්
* වැදගත්කම
* විධි හා ක්‍රම
* එක්රැස් කිරීම හා බෙදා හැරීම

2.4 නෝම්බිය (උපවාසය)
* වැදගත්කම
* විධි ක්‍රම හා ප්‍රයෝජන

2.5 හජ්
* වැදගත්කම
* විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටු කරන ක්‍රමය
* පර්ලු වාජිබ් සුන්නත්
* පර්ලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම් වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාමයන්

2.8 ප්‍රගාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිවිරුම හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර
* ඉපයීමේ වැදගත්කම
* ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
* අනිකුත් ගණුදෙනු (උදා.-තාවකාලිකව ඉල්ලා ගැනීම බදු ගැනීම)
* වක්පු, වසීය්යත්, වරාසත් (පොදු දේපළ, බූදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්ත්වයන්
* නිකාහයේ විධි හා ප්‍රයෝජන
* පවුල් ජීවිතය
* අඹු සැමියන්
* දෙමාපිය, දූ දරු අයිතිවාසිකම් හා යුතුකම් තලාක් හා ඉද්දා

2.13 ජිනායත්

* හුදුද්, කියාස්, තඃසීර් :

තුන්වන ප්‍රශ්න පත්‍රය

3. සීරා හා තාරිකු

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්ත්වයන්

3.1.1 නබි (සල්) තුමා
* නුබුව්වතයට පෙර ජීවිතය
* පවුල, පරම්පරාව
* තරුණ විය
* උතුම් ගුණාංග
* විවාහය

* නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය

නුබුව්වත් ලැබීම
ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
මිඃරාජ්
හිජ්රත්

* මදීනා ජීවිතය
සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
ඉස්ලාම් සම්පූර්ණ වීම
සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය
වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
කුලපාඋර්රා සීදූන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්
උමය්යා අබ්බාසිය්යා පාලන කාලය
බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය
මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන දායකත්වය

පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය
ඉමාම් බුහාරි (රහ්)
ඉමාම් ෂාපිර් (රහ්)
ඉමාම් ගස්සාලි (රහ්)
ඉමාම් අබ්දුල් කාදර් ජිලාන් (රහ්)
ඉමාම් ෂාදුලි (රහ්)

හතරවන ප්‍රශ්න පත්‍රය

4. අක්ලාක් (ඉස්ලාම් සාරධර්මය)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය
අක් ලාක් පිළිබඳ විස්තර
ඊමාන් අක්ලා අතර පවතින සම්බන්ධතාවය
අක්ලා හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා
වරඋසුහ්ද්
මුරාකබා, මුහාසපා
ෂමුක් (දේවකරුණාව)

4.3 දන්දීම
කැපවීම
කෘතඥභාවය
ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
බැගෑපත් වීම
කාලය අගය කිරීම
අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
අන් අයට ගෞරව කිරීම
යුක්තිය හා අවංකභාවය
තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්
අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය

ඇමුණුම - 02

අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තු වන නගර හා අංක

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |
| කළුතර දිස්ත්‍රික්කය | | 03 |
| පානදුර | 07 | |
| කළුතර | 08 | |
| අළුත්ගම | 09 | |
| මාතර දිස්ත්‍රික්කය | | 05 |
| වැලිගම | 11 | |
| මාතර | 12 | |
| කෑගල්ල දිස්ත්‍රික්කය | | 07 |
| මාවනැල්ල | 14 | |
| වරකාපොල | 15 | |
| කන්නන්තොට | 16 | |
| පුත්තලම දිස්ත්‍රික්කය | | 09 |
| නොරොච්චෝලෙයි | 21 | |
| පුත්තලම | 22 | |
| හලාවත | 23 | |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | 11 |
| කදුරුවෙල | 27 | |
| මහනුවර දිස්ත්‍රික්කය | | 13 |
| මහනුවර | 29 | |
| නාවලපිටිය | 30 | |
| දෙල්තොට | 31 | |
| ගෙලිඔය | 32 | |
| රත්නපුර දිස්ත්‍රික්කය | | 15 |
| ඇහැලියගොඩ | 34 | |
| බලංගොඩ | 35 | |
| මොණරාගල දිස්ත්‍රික්කය | | 17 |
| බිබිල | 38 | |
| මඩකලපුව දිස්ත්‍රික්කය | | 19 |
| කාත්තන්කුඩි | 43 | |
| එරාවූර් | 44 | |
| වාලච්චේනි | 45 | |
| වවුනියාව දිස්ත්‍රික්කය | | 21 |
| වවුනියාව | 49 | |
| මුලතිව් දිස්ත්‍රික්කය | | 23 |
| මුලතිව් | 51 | |
| යාපනය දිස්ත්‍රික්කය | | 25 |
| යාපනය | 53 | |

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කය | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| ගාල්ල දිස්ත්‍රික්කය | | 04 |
| ගාල්ල | 10 | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | | 06 |
| හම්බන්තොට | 13 | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | | 08 |
| කුලියාපිටිය | 17 | |
| කුරුණෑගල | 18 | |
| මැල්සිරිපුර | 19 | |
| පොල්ගහවෙල | 20 | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | 10 |
| අනුරාධපුරය | 24 | |
| කැකිරාව | 25 | |
| ගලෙන්බිඳුණුවැව | 26 | |
| මාතලේ දිස්ත්‍රික්කය | | 12 |
| මාතලේ | 28 | |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | | 14 |
| නුවරඑළිය | 33 | |
| බදුල්ල දිස්ත්‍රික්කය | | 16 |
| බදුල්ල | 36 | |
| වැලිමඩ | 37 | |
| අම්පාර දිස්ත්‍රික්කය | | 18 |
| අක්කරෙයිපත්තුව | 39 | |
| පොතුවිල් | 40 | |
| කල්මුණේ | 41 | |
| සමන්තුරේ | 42 | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | | 20 |
| මුතූර් | 46 | |
| කින්නියා | 47 | |
| ත්‍රිකුණාමලය | 48 | |
| මන්නාරම දිස්ත්‍රික්කය | | 22 |
| මන්නාරම | 50 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | | 24 |
| කිලිනොච්චි | 52 | |

ඇමුණුම - 03

විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය
(2004 වසරේ සිට පැවැත්වෙන විභාගවලට අදාල)

මෙකී විභාගයේ සෑම ප්‍රශ්ණ පත්‍රයක්ම පැය තුනක කාලයක ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරකින් යුක්තය.

1. *පළමුවන ප්‍රශ්න පත්‍රය.-* අකීදා හා ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා ක්‍රියාදාමයන් මූලිකාංග) හා අරාබි භාෂාව.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය. :

*I වන කොටස :* වාස්තවික (Objective Type) ප්‍රශ්න (ලකුණු 20)
ඉස්ලාම් මූලික සිද්ධාන්ත, ප්‍රධාන මූලිකාංග හා නෛතික මූලධර්මයන් හඳුනා ගැනීම :

(අ) අර්කානුල් ඊමාන්
(ආ) අකීදාවේ කොටස්
(ඉ) අල්කුරාණය
(ඊ) අල් හදීසය

මෙම කොටසට අයත් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ :

II. (අ) කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයක් (ලකුණු 10)
(ආ) බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න පහක් (ලකුණු 05)
(ඇ) හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහක් (ලකුණු 05)

*II වන කොටස :* ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40)
තව්හීද්හා එයට විරුද්ධ කරුණු උප මූලාංගයන් පැහැදිලිව විස්තර කිරීම :

(අ) තව්හීදිය හා එහි වර්ගයන්
(ආ) තව්හීදියට ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති
(ඇ) ඉජ්මාඋ හා කියාස්
(ඈ) ඉජ්තිහාද් සහ මුජ්තහීද්වරු

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරකින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එහි එක් කොටසක ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් (4 x 5= 20) ලකුණු දෙනු ලැබේ.

III වන කොටස : රචනාත්මක ප්‍රශ්න (ලකුණු 40)
නෛතික මූලධර්මවල ප්‍රායෝගිකත්වය හා ඒවා පිළිපැදීම :
(අ) අල්කුරාන් අල්හදීස් ඉතිහාසය
(ආ) අල්කුරානයේ ප්‍රධාන සූරා හා සූරාවට අදාළ අරාබි වචන අරාබි භාෂාවෙන් ලිවීම
(ඇ) ප්‍රධාන මද්හබ් සතර හා ඒවායේ ඉමාම්වරුන්
(ඈ) ඉජ්තිහාද් හා අනිකුත් මුජ්තහිද්වරුන්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම දැනුම, කුසලතාව, ආකල්ප පිළිබඳව ඇගයීම් කළ හැකි ආකාරයේ රචනාමය පිළිතුරු දිය යුතු ප්‍රශ්න වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලබා දිය හැක.

2. *දෙවන ප්‍රශ්න පත්‍රය* : අල්ෆික්හුල් ඉස්ලාමි (ඉස්ලාමීය නීති මාලාව)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය. :

*I වන කොටස* : වාස්තවික ප්‍රශ්න 40 (Objective Type 40) (ලකුණු 20)
පංචමහ යුතුකම් සහ අනිකුත් එදිනෙදා කටයුතු ඉබාදත් වශයෙන් යොදා ගැනීම :

(අ) තහාරත් හා නජීසය
(ආ) පංච මහ යුතුකම්
(ඇ) අනිකුත් ඉබාදත්

මෙම කොටසට අයත් සියළු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය :

1. (අ) පොදු උත්තර සැපයීම ප්‍රශ්න දහයයි (ලකුණු 10)
(ආ) බහුවරණ ප්‍රශ්න ප්‍රශ්න පහයි (ලකුණු 05)
(ඇ) හිස්තැන් පිරවීම ප්‍රශ්න පහයි (ලකුණු 05)

*II වන කොටස* : ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40)
මුආමලාත්, මුනාකබාත්, ජිනායාත් ආදී ක්‍රියාකාරකම් ඉබාදත් කර ගැනීම :

(අ) පංචමහ යුතුකම්
(ආ) අනිකුත් සුන්නත් ඉබාදත්
(ඇ) විවාහ හා පවුල් ජීවිතය
(ඈ) මුආමලාත්
(ඉ) ජිනායාත්

මෙම කොටසේ ඇති ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එක් ප්‍රශ්න කොටසකට ලකුණු 05 බැගින් (4 x 5 = 20) ලකුණු ලැබේ.

*III වන කොටස* : රචනාගත ප්‍රශ්න (ලකුණු 40)
පර්ලු, සුන්නත්, ඉබාදත්වල ප්‍රයෝජනයන් හා දර්ශනයන් දැනගෙන ක්‍රියාකිරීම :

(අ) පංචමහ යුතුකම්
(ආ) වෘතිමය කටයුතු
(ඇ) වැරදි හා දඬුවම්
(ඈ) විවාහය හා පවුල් ජීවිතය

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම දැනුම, කුසලතා ආකල්ප ඇගයීමට ලක්කළ හැකි රචනාත්මක පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් දෙනු ලැබේ.

3. *තුන්වන ප්‍රශ්න පත්‍රය* : සීරා හා තාරික්කු

නබි (සල්) තුමාගේ ඉතිහාසය හා අනිකුත් ඉතිහාස

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය :

*I වන කොටස* : වාස්තවික ප්‍රශ්න (ලකුණු 20)
නබි (සල්) තුමාගේ හා සහබාවරුන්ගේ හා අනිකුත් ඉතිහාස දැනගැනීම :

(අ) ජාහිලියා කාලයේ ආගමික සමාජ තත්ත්වය
(ආ) නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
(ඇ) සහාබාවරුන් ඉස්ලාමයට කළ දායකත්වය
(ඈ) උමයියා අබ්බාසියා කාලයන්

මෙම කොටසේ ප්‍රශ්නවලට සියලුම විභාග අයදුම්කරුවන් පිළිතුරු සැපයීම අවශ්‍යය. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්තය :

1. (අ) කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයයි (ලකුණු 10)
(ආ) බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න 05 (ලකුණු 05)
(ඇ) හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහයි (ලකුණු 05)

(සම්පූර්ණ ලකුණු 20)

*II වන කොටස* : ව්‍යුහගත ප්‍රශ්න - ලකුණු 40

(අ) නබි (සල්) තුමාගේ මක්කා ජීවිතය
(ආ) නබි (සල්) තුමාගේ මදීනා ජීවිතය
(ඇ) කුලපාඋර්රාසි දූරන්වරුන්ගේ ඉතිහාසය
(ඈ) විවිධ ගෝත්‍රවලට අයත් ඉමාම්වරුන්ගේ දායකත්වයන්
(ඉ) බයිතුල් මුකද්දාස්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කිසියම් ප්‍රශ්න

දෙකකට උත්තර සැපයිය යුතු වේ. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එක් ප්‍රශ්න කොටසකට ලකුණු 05 බැගින් දෙනු ලැබේ (5 x 4 = 20).

*III වන කොටස :* රචනාගත ප්‍රශ්න ලකුණු 40 නබි(සල්)තුමා විසින් පෙන්වා දෙන ලද ඉස්ලාමී සමාජයීය දේශපාලන අවශ්‍යතාවන් ගැන අවබෝධ කිරීම :

(අ) නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
(ආ) අල්කුල පා උර්රාෂිදූන්වරුන්ගේ දේශපාලන දායකත්වය
(ඇ) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා කැපවීම
(ඈ) මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික දායකත්වය

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරෙන් යම්කිසි ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතු වේ. ලකුණු 20ක් බැගින් දෙනු ලැබේ.
(මුළු ලකුණු 5 x 20 = 100)

4. *හතරවැනි ප්‍රශ්න පත්‍රය - අල් අක්ලාක්*

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

*I වන කොටස :* වාස්තවික ප්‍රශ්න (ලකුණු 20) :

(අ) සාරධර්ම පිළිබඳ ඉස්ලාමීය දැක්ම
(ආ) තක්වා
(ඇ) පුණ්‍ය කර්ම
(ඈ) ආදිල්

මෙම කොටසේ ප්‍රශ්න හතරටම උත්තර සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් මෙම කොටසට ලකුණු 20 ක් හිමිවේ.

*II වන කොටස :* ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40) :

* අක්ලාක් සහ ඊමානය
* මුරාකබා සහ වරළ
* සමාජීය සම්බන්ධතා පිළිබඳ සාරධර්ම
* කාල කළමනාකරණය සංවේදන පාලනය කිරීම

මෙම කොටසේ ප්‍රශ්න වලින් දෙකකට උත්තර ලිවිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම අ, ආ, ඇ, ඈ යනුවෙන් කොටස් කර ඇත. එක් ප්‍රශ්නයකට 5x4=20 වශයෙන් ලකුණු පිරි නැමේ.

*III වන කොටස :* රචනාමය ප්‍රශ්න (ලකුණු 40) :

* ඉස්ලාමීය සාරධර්ම තුළින් ආදරය, කරුණාව යන මානුෂික ගුණධර්ම වර්ධනය
* ඉබාදත් මගින් යහපත් සංකල්ප ප්‍රදර්ශනය වීම
* ජීවින්ට කරුණාව දැක්වීම
* ඉස්ලාමීය නීති
* තරුණ පරපුරේ තිබිය යුතු යහපත් ගතිගුණ

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර ලිවිය යුතුය. එක් එක් උත්තරයකට ලකුණු 20 බැගින් ලකුණු 40ක් පිරිනැමේ.

12-459

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයේ (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය), ඕල්කොට් මාවත, කොළඹ 10, ඩිප්ලෝමා මට්ටමේ වෘත්තීය පාඨමාලා (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් (NVQ Level) 05 සහ 06) සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම - 2009

මෙම නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයේ (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය) පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රය" ට අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක තම තමන්ගේ අයදුම්පත් අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතුවේ. සෑම අයදුම්පත්‍රයක්ම ආදර්ශ අයදුම්පතෙහි 13 වන අංකය යටතේ සඳහන් වන පරිදි වලංගු රු. 10 ක මුද්දරයක් අලවා සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2009.01.02 වැනි දිනට හෝ ඊට පෙර, විදුහල්පති, ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය) ඕල්කොට් මාවත, කොළඹ 10 ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මෙම පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකු/ඉල්ලුම්කාරියක :—

(i) මනා චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

05. සුදුස්සන් තෝරා ගනු ලබන්නේ තෝරා ගැනීම්, අභියෝග්‍යතා පරීක්ෂණයක හා /හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

06. ලිපිලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. තේරීම් පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛන ඉදිරිපත්කර, යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

07. සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්ත්වය මත විද්‍යාලයේ පංතිවලට සහභාගී වන සෑම දිනකටම රු. 20 ක දීමනාවක්, මසකට රු. 450 ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.

පාඨමාලා හදාරණ අඩු ආදායම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සීමිත සංඛ්‍යාවකට රු. 2,500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යාධාරයක් ද ගෙවනු ලැබේ.

08. සිය ලිපි ලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. වංචනිකව, වෙනස් කිරීම් සනාථ වන සේ ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වන සේ ලිපිලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියා කරනු ලැබේ.

ඕනෑම අයදුම්කරුවකු විසින් තමන් කැමති ඕනෑම පාඨමාලාවකට වෙන වෙනම ඉල්ලුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ හැක.

ආචාර්ය එච්. එල්. ඔබේසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ
දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

### ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය)- ඩිප්ලෝමා මට්ටමේ වෘත්තීය පාඨමාලා (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් (NVQ Level) 05 සහ 06) සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අයදුම්පත - 2009 අධ්‍යයන වසර

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. [ ]

(අයදුම්පත්‍රය විදුහල්පති, ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය) ඕල්කොට් මාවත, කොළඹ 10 වෙතට යැවිය යුතුය.)

ඉල්ලුම් කරන සෑම පාඨමාලාවක් සඳහා වෙන වෙනම අයදුම්පත් අවශ්‍ය වේ.

01. කාර්මික විද්‍යාලයේ නම :————.

02. පාඨමාලාවේ නම :————.

03. මාධ්‍යය :————.

04. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.

05. මුලකුරු වලින් කියවෙන නම් :————.

06. ස්ථිර ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. දිස්ත්‍රික්කය :————. ඡන්ද කොට්ඨාසය :————.

ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

09. උපන් දිනය :————.

2009.01.01 දිනට වයස

අවුරුදු :————. මාස :————. දින :————. ස්ත්‍රීපුරුෂ භාවය :————.

10. ඇතුළත්වීමේ සුදුසුකම් ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ඔබ ලබා ඇති සුදුසුකම් පහත සඳහන් අදාළ කොටුවේ සඳහන් කරන්න.

| සුදුසුකම් අංකය | ඇතුලත්වීමේ සුදුසුකම් පිළිබඳ විස්තර | | | | |
|---|---|---|---|---|---|
| | ලබා ඇති සහතික පිළිබඳ විස්තර | NVQ මට්ටම (අදාළ වේ නම්) | සහතිකය නිකුත් කළ ආයතනයේ නම | අදාළ සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර | සේවා කාලය |
| 01 යටතේ | | | | | අවු. මාස |
| 02 යටතේ | | | | | අවු. මාස |

11. ඉහත වගුවට අදාළ නොවන වෙනත් සහතික, සේවා කාලය ආදිය පිළිබඳ අදාළ තොරතුරු ඇත්නම් :————.

12. අධ්‍යාපන සුදුසුකම් :

I. අ. පො. ස. (සා. පෙළ) :
විභාග අංකය :————. වර්ෂය :————.

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| | |

II. අ. පො. ස (උ. පෙළ) ප්‍රතිඵල :
විභාග අංකය :————. වර්ෂය :————.

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| | |

13. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මා විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු මම දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම්කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද, ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයට (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය), සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ පරිපාටියට එකඟවීමට ද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

| රු. 10 ක මුද්දර අලවා ඒ මත අත්සන තබා අවලංගු කරන්න. |
|---|

ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයේ (ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය), ඕල්කොට් මාවත, කොළඹ 10
පැවැත්වෙන පාඨමාලා පිළිබඳ විස්තර - 2009 වර්ෂය සඳහා

**ඩිප්ලෝමා මට්ටමේ වෘත්තීය පාඨමාලා**
ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 05 සහ 06 -NVQ Level 05 & 06

| සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | සුදුසුකම් අංකය | ඇතුලත්වීමේ සුදුසුකම් |
|---|---|---|---|
| COT/Weld 5 & 6 | පෑස්සුම් ශිල්පය NVQ Level 05 and 06 | (01) | පහත සඳහන් සුදුසුකම්වලින් අවම වශයෙන් එකක් හෝ සපුරාලිය යුතුය. |

| සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | සුදුසුකම් අංකය | ඇතුලත්වීමේ සුදුසුකම් |
|---|---|---|---|
| | පූර්ණ කාල දිවා දෑවුරුදු<br>මාධ්‍ය -ඉංග්‍රීසි | | ආයතනික පුහුණුව හෝ පෙර ඉගැනුම් හඳුනාගැනීම් (RPL) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 03 හෝ ඉහල මට්ටමක් ලබා තිබිය යුතුයි.<br>(i) පෑස්සුම්කරු - (Welding) හෝ<br>(ii) ලෝහ එකලස්කරු -(Metal Fabricator) හෝ |
| | පෑස්සුම් ශිල්පය<br>NVQ Level 05 & 06<br>අර්ධ කාලීන/සති අන්ත සිව් අවුරුදු මාධ්‍ය- ඉංග්‍රීසි | (02) | අවුරුද්දකට නොඅඩු අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද හෝ පාඨමාලාවක් හදාරා පිළිගත හැකි වෘත්තීය සහතිකයක් ලබා තිබීම, |
| COT/Mech 5& 6 | Mechatronics -NVQ Level 05 ) 06<br>පූර්ණ කාල දිවා දෑවුරුදු<br>මාධ්‍ය - ඉංග්‍රීසි | (01) | පහත සඳහන් සුදුසුකම්වලින් අවම වශයෙන් එකක් හෝ සපුරාලිය යුතුය.<br>ආයතනික පුහුණුව හෝ පෙර ඉගැනුම් හඳුනාගැනීම් (RPL) මගින් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 03 හෝ ඉහළ මට්ටමක් ලබා තිබිය යුතුයි.<br>(i) යන්ත්‍රණ ශිල්පී - (Machinist) හෝ<br>(ii) විදුලි කාර්මික (Electrician) හෝ<br>(iii) ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියාකරණය ශිල්පි (Radio, TV and Allied Equipment Rapairer) |
| | Mechatronics - NVQ Level 05 and 06<br>අර්ධ කාලීන/සති අන්ත සිව් අවුරුදු<br>මාධ්‍ය - ඉංග්‍රීසි | | (iv) උපකරණ හා අච්චු සාදන්නා (Tool and Die Maker) හෝ<br>(v) වායව කාර්මික - (Pneumatic Technician) හෝ<br>(vi) තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී - ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 03 හෝ ඉහල මටට්ම් ලබා තිබිය යුතුය. (Tea Factory Mechanic NVQ Level 03 or higher) හෝ |
| | | (02) | අවුරුද්දකට නොඅඩු අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් හෝ පාඨමාලාවක් හදාරා පිළිගත හැකි වෘත්තීය සහතියක් ලබා තිබීම. |
| COT/IT 5& 6 | තොරතුරු තාක්ෂණය<br>NVQ Level 05 and 06<br>පූර්ණ කාල දිවා දෑවුරුදු<br>මාධ්‍ය - ඉංග්‍රීසි | (01) | පහත සඳහන් සුදුසුකම්වලින් අවම වශයෙන් එකක් හෝ සපුරාලිය යුතුය.<br>ආයතනික පුහුණු හෝ පෙර ඉගැනුම් හඳුනාගැනීම් (RPL) මගින් ජාතික වෘත්තීය සුදුසුකම් මටට්ම් 03 හෝ ඉහල මට්ටමක් ලබා තිබිය යුතුයි.<br>(i) Computer Application Assistant - (පරිගණක පද්ධති සහකාර)<br>(ii) Hardware Technician (දෘඩාංග තාක්ෂණික) හෝ<br>(iii) Network Technician (ජාල තාක්ෂණික) හෝ<br>(iv) Graphic Designer - (ග්‍රැපික් නිර්මාණකරු) හෝ |
| (02) | තොරතුරු තාක්ෂණය<br>NVQ Level 05 and 06<br>අර්ධ කාලීන/සති අන්ත සිව් අවුරුදු මාධය - ඉංග්‍රීසි | (02) | (v) Desktop Publisher - (ඩෙක්ස්ටොප් පබ්ලිෂර්) හෝ<br>අවුරුද්දකට නොඅඩු අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් හෝ පාඨමාලාවක් හදාරා පිළිගත හැකි වෘත්තීය සහතිකයක් ලබා තිබීම. |

සටහන

අදාල ඇතුළත්වීමේ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පහත සඳහන් පරීක්ෂණයන් මගින් තෝරා ගනු ලැබේ.

(i) තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය
(ii) යෝග්‍යතා පරීක්ෂණය හා
(iii) චිත්ත ආකල්පමය හැකියාවන් සඳහා වූ සම්මුඛ පරීක්ෂණයකින් සමත් විය යුතුය.

තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ දී ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන ඒකක වලින් සමන්විතය. අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය විෂය සඳහා සම්මානයක් ද ඉංග්‍රීසි හා විද්‍යාව විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් මෙම පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. එහෙත් යෝග්‍යතා පරීක්ෂණයට හා සම්මුඛ පරීක්ෂණයට සියළුම අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය.

12-498

## යොවුන් සේනාංකය

### තරුණ කටයුතු අමාත්‍යාංශය

### යොවුන් රේන්ජර් පුහුණු මධ්‍යස්ථාන සඳහා රැකියා පුහුණුව සඳහා තරුණ තරුණියන් බඳවා ගැනීම - 2009

1. පාසල් අධ්‍යාපනය නිමකර සිටින ඔබට සාර්ථක අනාගතයකට අවශ්‍ය දැනුම, පෞරුෂත්ව සංවර්ධනය, භාෂා කුසලතා සංවර්ධනය සහ පරිඝනක සාක්ෂරතාවය ලබා දෙමින් ඔබේ අනාගත ඉලක්ක විශිෂ්ඨ ලෙස ජය ගැනීම සඳහා අවශ්‍ය සවිමත් පදනම 'පාසලෙන් වැඩබිමට' තේමාව යටතේ ගොඩනැගීම යොවුන් රේන්ජර් පුහුණු වැඩසටහනේ අරමුණයි. මෙරට හා පිටරට රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් මෙන්ම ආත්ම අභිමානයෙන් යුතුව ඔපනැංවූ සහජ හැකියා තුළින් අනාගතය සාර්ථක කර ගැනීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කළ හැක.

2. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

* 2009.01.15 දිනට වයස අවුරුදු 18-28 ත් අතර වයස් කාණ්ඩයට අයත් වීම.
* පාසල් අධ්‍යාපනය නිමාකර තිබීම හා අවම වශයෙන් අ. පො. ස. (සා. පෙ) විභාගයට පෙනී සිටීම.
* බාල දක්ෂ, ශිෂ්‍ය භට, ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී තිබීම විශේෂ සුදුසුකමකි.

3. *පුහුණු පාඨමාලා ආරම්භ කරන දිනයන් :*

* ආයතනික පුහුණුව (සියළු වැඩකරන දිනයන්හි උදෑසන 7.30 සිට සවස 4.30 දක්වා)
* සවිබල ගැන්වීම.
* මාස 06 ක ආයතනික පුහුණුව අවසානයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම.

| *ආයතනික පුහුණුව* | *සවිබල ගැන්වීම* |
|---|---|
| භාෂා නිපුණත්වය (ඉංග්‍රීසි) | බැහැරගත පුහුණුව |
| පරිඝණක පුහුණුව | ව්‍යවසායකත්ව සංවර්ධනය |
| සන සරඹ හා ශාරීරික අධ්‍යාපනය | ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් |
| වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය | පුද්ගල සමූහ පැවැරුම් |
| | ජීවනෝපාය සංවර්ධනය |
| සමාජ විද්‍යාව | භාවනා මගින් මානසික ඒකාග්‍රතාවය |
| සෞන්දර්ය අධ්‍යාපනය (නර්තනය, සංගීතය, චිත්‍ර කලාව) | |

4. *ඔබට ලැබෙන ප්‍රතිලාභ :*

* මූලික පුහුණු මාස 06 තුළ සුභසාධක හා දිරිදීමනා;
* මූලික පුහුණු කාලසීමාවෙන් පසු කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම;
* ක්‍රීඩා හා සංස්කෘතික පුහුණු වැඩමුළු, තරුණ කඳවුරු;
* පුහුණුව අවසානයේ නිපුණතාවය පිළිබඳ සහතිකපත්;
* වෘත්තීය පුහුණුව සඳහා දීමනා;
* රැකියා සඳහා යොමු කිරීම.

05. *අයදුම්පත් යොමුකිරීම*

ආදර්ශ අයදුම්පත අනුව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් 2009.01.10 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ආසන්නම යොවුන් රේන්ජර් පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කරන්න.

06. *සම්මුඛ පරීක්ෂණ :*

යොවුන් සේනාංක වැඩසටහන සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය ඔබ විසින් ඉල්ලුම් කළ යොවුන් රේන්ජර් පුහුණු මධ්‍යස්ථානයේ දී 2009.01.10 දින පෙ.ව. 9.00 සිට පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය අවසානයේ තෝරාගත් අයදුම්කරුවන්ට ඒ බව දැනුම් දෙනු ලැබේ.

__________.
අධ්‍යක්ෂ,
යොවුන් සේනාංකය.

යොවුන් සේනාංක මූලස්ථානය,
අංක 35 ඒ,
ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත,
කොළඹ 08.

දුරකථන අංක : 060-2152660, 060-2152661, 060-2152662

### යොවුන් සේනාංකය - අයදුම් පත්‍රය

1. දිස්ත්‍රික්කය : ☐ 2. ඡන්ද කොට්ඨාසය : ☐

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ☐ 4. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ☐

5. පුහුණුවීම සඳහා ඉල්ලුම් කරන යොවුන් දිරිය පුහුණු මධ්‍යස්ථානයේ නම : ☐

6. සම්පූර්ණ නම පෙළපත් නාමය සමග (ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි) : ☐

7. මුලකුරු සමග නම (ඉංග්‍රීසි අකුරුවලින්) : ☐

8. ස්ථිර ලිපිනය : ☐

9. උපන් දිනය : ☐

2008.01.16 දිනට වයස අවු : ☐ මාස : ☐ දින : ☐

10. ජාතික හැඳුනුම්පත් අංකය : ☐

11. ස්ත්‍රී පුරුෂ භාවය : ☐

12. අධ්‍යාපන සුදුසුකම් :

1. අ. පො. ස. (උ/පෙළ) සමත් ☐

2. අ. පො. ස. (සා/පෙළ) සමත් ☐

13. අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් : ☐

(පාසල් ශිෂ්‍ය නායක, ක්‍රීඩා නායක, නිවාසාන්තර, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා කරන සහ සමිති සමාගම් ස්වේච්ඡා) සංවිධාන, දහම් පාසල්වල කටයුතු කර ඇත්නම් එම තොරතුරු)

14. නිර්මාණශීලී ක්‍රියාකාරකම් : ☐

15. දැනට රැකියාවක නිරතවන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

☐

16. අනාගත වෘත්තීය අපේක්ෂාව :

1. රාජ්‍ය අංශයේ රැකියාවක් ☐
2. පෞද්ගලික අංශයේ රැකියාවක් ☐
3. තමාගේම ව්‍යාපාරයක් ☐
4. විදේශ රැකියාවක් ☐
5. සහජ හැකියාවට රැකියාවක් ☐
6. වෙනත් ☐

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවට මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

☐
අයදුම්කරුගේ අත්සන

දිනය ☐

**යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ලේඛනය**

| | *යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ නම* | *යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|
| 1. | බියගම | හෙයියන්තුඩුව, මාකොළ දකුණ, මාකොළ | 011-2964040 |
| 2. | කටුනායක | ධම්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක | 011-2260020 |
| 3. | අත්තනගල්ල | වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව | 033-2282232 |
| 4. | දොම්පේ | නැදුන්ගොල්ලවත්ත, මණ්ඩාවල, දොම්පෙ | 060-2339834 |
| 5. | යක්කල | වැරැල්ලවත්ත, යක්කල, ගම්පහ | 033-2233534 |
| 6. | දිවුලපිටිය | වල්පිට, හෙට්ටිපොළ, දිවුලපිටිය | 033-2272875 |
| 7. | බුලත්සිංහල | බුලත්සිංහල | 034-2282322 |
| 8. | ගම්පොල | ගුරු අභ්‍යාස විද්‍යාලය, ගම්පොල | 081-2352335 |
| 9. | නාවුල | අරන්ගල, නාඋල | 066-2246204 |
| 10. | දඹුල්ල | ඉනාමළුව, දඹුල්ල | 066-2286177 |
| 11. | නුවරඑළිය | මිපිළිමාන, අඹේවෙළ, නුවරඑළිය | 060-2536332 |
| 12. | හඟුරන්කෙත | රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත | 081-2365849 |
| 13. | ගාල්ල | වැකුණුගොඩ, බෝපේ, ගාල්ල | 091-2233182 |
| 14. | අක්මීමණ | ඉහලගොඩ, වලහන්දූව, අක්මීමණ | 060-2932436 |
| 15 | අකුරැස්ස | මාරඹ, අකුරැස්ස | 041-4921003 |
| 16. | එරම්ණියාය | හුංගම, එරම්ණියාය | 060-2489156 |
| 17. | වීරකැටිය | නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047-2257143 |
| 18. | සූරියවැව | සූරියවැව, තිස්සමහාරාමය | 047-2288169 |
| 19. | කන්තලේ | සීනිපුර, කන්තලේ | 026-2244088 |
| 20. | කුලියාපිටිය | දෙගම්මැද, වැවගම, කුලියාපිටිය | 060-2879228 |
| 21. | වාරියපොල | උසාවි මාවත, වාරියපොල | 060-2973575 |
| 22. | මාවතගම | ඩෙන්වෝර් වත්ත, මාවතගම | 037-2298668 |
| 23. | පඬුවස්නුවර | නුගවැල හන්දිය, තුත්තිරිපිටිගම, පඬුවස්නුවර | 037-2291803 |
| 24. | දොඩන්ගස්ලන්ද | අලකොළමඩ, මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද | 037-4924982 |
| 25. | නාත්තන්ඩිය | සාගරගම, නාත්තන්ඩිය | 032-5673377 |
| 26. | කැකිරාව | මහවැලි පෙදෙස, කැකිරාව | 025-2263297 |
| 27. | කලාවැව | ගල්නෑව, බුල්නෑව, කලාවැව | 025-2269946 |
| 28. | පාලාඩිකුලම් | පාලාඩිකුලම්, අනුරාධපුරය | 060-2852809 |
| 29. | අරලගංවිල | හංසයා පාළම, අරලගංවිල, පොළොන්නරුව | 060-2279016 |
| 30. | බණ්ඩාරවෙල | බිඳුණුවැව, බණ්ඩාරවෙල | 057-2222214 |
| 31. | මහියංගණය | මාපාකඩවැව, මහියංගනය | 060-2594960 |
| 32. | තණමල්විල | සර්වෝදය මධ්‍යස්ථානය, තණමල්විල | 060-2483112 |
| 33. | නිවිතිගල | අම්බලන්දෙනිය, වටාපොත පාර, නිවිතිගල | 045-2279970 |
| 34. | බටංගල | බටංගල පනාවල, දැරණියගල | 036-2258108 |
| 35. | ගලිගමුව | ආසිදෙණිය, ගලිගමුව | 060-2359735 |
| 36. | කෑගල්ල | ගංගොඩවත්ත, කෑගල්ල | 060-2352600 |

12-550

---

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2007

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීමට අංක 1565 හා 2008.08.29 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරන අතර ඒ වෙනුවට මෙම ගැසට් නිවේදනය පළ කරනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනයේ ඇතුළත් කර ඇති තනතුරු දරන නිලධාරීන් 2008.08.29 දිනැති ගැසට් නිවේදනය යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇත්නම් ඔවුන් නැවත මෙම විභාගය සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවන බවද එම අයදුම්පත් මෙම ගැසට් නිවේදනයේ අඩංගු කොන්දේසි වලට යටත්ව මෙම විභාගය සඳහා වලංගු වන බව ද දන්වමි.

මෙම නිවේදනයේ 'ලේකම්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ය. "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "ශ්‍රී ලංකා පරිපාලන සේවය" යි.

1. ලිඛිත විභාගය : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ :-

(i) සාමාන්‍ය පරිපාලනය;
(ii) මුදල් රෙගුලාසි;
(iii) විෂයානුබද්ධ අධ්‍යයනය.

විභාග දිනය : මෙම විභාගය 2009 අප්‍රේල් මස කොළඹ නගරයේදී (නගර අංක 01) හා යාපන නගරයේදී (නගර අංක 2) පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන්

සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම්ට බලය ඇත. මේ අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය නිවැරදිව ඉල්ලුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සටහන් කරන්න. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩදෙනු නොලැබේ.

සම්මුඛ පරීක්ෂණය.—ලිඛිත විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි, සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

2. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. සේවා කොන්දේසි : රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 සහ 2005.11.14 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද) 2005.10.28 වන දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධන වලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වන පන්තියට පත් කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

4. ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1,310 - රු. 58,110/-
i වැනි පන්තිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555/-
ii වැනි පන්තිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705/-
iii වැනි පන්තිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385/-

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තිය සඳහා වේ.

(පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ පත්වීමේ දින සිට වසර 06ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.)

5. සුදුසුකම්.—මෙම ඡේදයේ අවසානයේ ඇති සටහන් වල විධිවිධානයන්ට යටත්ව.—

අ. (i) පහත සඳහන් සේවා/ශ්‍රේණි වල ස්ථිර කරන ලද රජයේ නිලධාරියකු වන; සහ
(ii) එවැනි සේවා/ශ්‍රේණි එකක් හෝ ඊට වැඩි ගණනක හෝ අවු. 10කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින; හෝ

ආ. (i) පහත සඳහන් සේවා/ශ්‍රේණි වල ස්ථිර කරන ලද රජයේ නිලධාරියකු වන හා එවැනි සේවා/ශ්‍රේණි එකක හෝ ඊට වැඩි ගණනක හෝ අවු. 05කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින; සහ
(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු වීම

සටහන : (අ) උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතු අතර එදිනට හෝ ඊට පෙර ඉහත 5.අ(I) සහ (II) හෝ 5.(ආ) (I) සහ (II) හි දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින්ද යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

සේවා හා ශ්‍රේණි :

(i) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනය යටතේ වන පහත සඳහන් ඕනෑම ඒකාබද්ධ සේවයකට අයත් නිලධාරියකු;
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්, භාෂා පරිවර්තක, පුස්තකාලයාධිපති.
(ii) පහත සඳහන් ඕනෑම ලිපිකරු සේවයකට අයත් නිලධාරියකු;
දුම්රිය, රජයේ මුද්‍රණාලය, සෞඛ්‍ය
(iii) පහත සඳහන් ඕනෑම දෙපාර්තමේන්තු ශ්‍රේණියක නිලධාරියකු හෝ එවැනි ශ්‍රේණියක සේවය කොට පසුව පළාත් රාජ්‍ය සේවයේ සමාන ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය කළ නිලධාරියකු;

| දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ | ශ්‍රේණි |
|---|---|
| සියලුම අමාත්‍යාංශ | සහකාර ලේකම් (ශ්‍රී. ලං. ප. සේ නොවන) මහජන සම්බන්ධතා නිලධාරි |
| තරුණ කටයුතු අමාත්‍යාංශය ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)/දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, ක්‍රීඩා නිලධාරී |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ප්‍රතිපත්ති ක්‍රම සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව | ව්‍යාපෘති නිලධාරි, සංඛ්‍යාන මිනුම් නිලධාරි, සංඛ්‍යාන සහකාර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරි |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි, බලයලත් නිලධාරි |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | සංඛ්‍යා ලේඛණ විමර්ශක |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ආයුර්වේද දෙපාර්තමේන්තුව | රෝහල් ලේකම් විමර්ශන නිලධාරි |
| සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය සමාජ සේවා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය) සුභසාධන හා සමාජ සුභසාධන අධිකාරි, වැඩිහිටි හා ආබාධිත නිවාස අධිකාරි, සමාජ සේවා නිලධාරි |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මුල් ගුරු, මුල් ගුරුවරිය, පරිවාස නිලධාරි, නේවාසිකාගාර පාලක, නිවාස පාලක, නිවාස පාලිකා |

| | |
|---|---|
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | ඉඩම් නිලධාරී/දිස්ත්‍රික් ඉඩම් නිලධාරී |
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | (දෙපාර්තමේන්තුමය)/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී/ කච්චේරි මිනින්දෝරු/ජනපද නිලධාරී |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ග්‍රාම නිලධාරී |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | පර්යේෂණ සහකාර, පරිවර්තක |
| කම්කරු සබඳතා සහ මිනිස් බල අමාත්‍යාංශය | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | කර්මාන්ත සහකාර, සාමාන්‍යාධිකාරී, කළමනාකරණ සහකාර, ආර්ථික කාර්මික සහකාර |
| සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය | රෝහල් ලේකම්, සැලසුම් හා වැඩසටහන් නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක, ලියාපදිංචි හා සහකාර වෛද්‍ය නිලධාරී |
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය<br>පළාත් සභා දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය), පළාත් පාලන ලිපිකරු නිලධාරී, භාෂා පරිවර්තක, සරප්, ලඝු ලේඛක, යතුරු ලේඛක, ගබඩාභාර නිලධාරී |
| වෙළඳ අළෙවි සංවර්ධන හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය<br>මිණුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | කිරුම් මිණුම් පරීක්ෂක, මිල පාලන පරීක්ෂක |
| කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම උපදේශක<br>ප්‍රාදේශීය නිලධාරී<br>සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව<br>ශ්‍රේෂ්ඨාධිකරණය | භාෂා පරිවර්තක, ප්‍රකාශන සහකාර, ලඝු ලේඛක |
| ප්‍රවාහන අමාත්‍යාංශය<br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ වාහන පරීක්ෂක |
| වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය | සැලසුම් සහකාර |
| **වාරිමාර්ග දෙපාර්තමේන්තුව** | |
| මධ්‍යම ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරීන් /ග්‍රාම සංවර්ධන ජ්‍යෙෂ්ඨ අධීක්ෂක/ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන සහකාර/ ග්‍රාම සංවර්ධන නිලධාරී/ග්‍රාම සංවර්ධන සහකාර |
| සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>ජාතික කෞතුකාගාරය<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික නිලධාරීන් |
| අධ්‍යාපන අමාත්‍යාංශය | ශිෂ්‍ය නිවාස අධිකාරී |
| තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,<br>රජයේ මුද්‍රණාලය | ප්‍රවෘත්ති නිලධාරී<br>සෝදුපත් කියවන්නා |
| තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය<br>තැපැල් දෙපාර්තමේන්තුව | ටී 3-5-1 හා ටී 3-4 වැටුප් පරිමාණයේ සිටින ඒකාබද්ධ තැපැල්සේවා නිලධාරීන්, ඒකාබද්ධ තැපැල් සේවයේ තැපැල් සේවා නිලධාරීන් ආ 1 |
| ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර සහකාර |
| සමුපකර සංවර්ධන දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් නිලධාරී/සමූපකාර සමිති පරීක්ෂක |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | ආහාර පාලන පරීක්ෂක (කලින් ආහාර හා මිල පාලන පරීක්ෂක) |

(ඈ) පළාත් රාජ්‍ය සේවයේ : ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියෙකු,
ලිපිකරු, ලඝු ලේඛක, යතුරු ලේඛක, සරප්, පොත් තබන්නා, භාෂා පරිවර්තක, ගබඩා භාරකරු, පුස්තකාලයාධිපති.

(ඉ) පළාත් රාජ්‍ය සේවයේ : ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියෙකු,

ආදායම් පරීක්ෂක, කම්කරු හා සුභසාධන නිලධාරී, කිරුම් මිනුම් පරීක්ෂක, කොළඹ මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහන නිලධාරී, මාණ්ඩලික නිලධාරී සහ ලේකම්, කළමනාකරණ සේවා නිලධාරී, පළාත් පාලන නිලධාරී.

(ඊ) මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන තනතුරුවලට අයත් නිලධාරීන් විභාගයට අයදුම්කිරීම නීති විරෝධී වන අතර (තනතුරු නාමයන් වෙනස්වීම හේතුවෙන් නව තනතුරුවලට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් හැර) ඔවුන් යම් ආකාරයකින් විභාගයට පෙනී සිටියද පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

සටහන.- (i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 5 තුළ සතුටුදායක සේවා වාර්තාවක් නොමැති නම් විභාගයට පෙනී සිටියද පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

(ii) අයදුම්කරුවෙකු,

(අ) සුදුසුකම් සම්පූර්ණ කළයුතු දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇත්නම් ද, සහ

(ආ) මෙම කාලය තුළ කරන ලද වරදකට (අවවාද කිරීම් හැර) කිසියම් දඬුවමක් ලබා නැත්නම් ද, ඔහුට සතුටුදායක සේවාවක් තිබුනේ යැයි සළකනු ලැබේ.

(iii) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියෙකු සුදුස්සෙකු නොවේ.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 5 (1) හෝ 5(2) හෝ ප්‍රකාර තරඟ විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිවෙකුට අවසර නොමැත.

6. *විභාග ගාස්තු :* විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 1/2 x 12 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාගේ අත් අකුරින්ම පිරවිය යුතුය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

(ඇ) විභාගය පිණිස වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල්ට 2009 ජනවාරි මස 19 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ඉල්ලුම් පත් දමා ඇති කවරයේ ඉහළ වම් කොටසෙහි පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට වන සීමිත තරඟ විභාගය - 2007" යන වචන සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(ඉ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දොපර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයත් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය, පිටපතක් ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

8. *විභාගයට ඇතුල්වීම :*

(අ) ඉල්ලුම් පත් එවා ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ පරිපාලකට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංක යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමු වැනි දින තම ප්‍රවේශ පත්‍රය පරිපාලකට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

සටහන : අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහුට හෝ ඇයට විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම පරිපාලක සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍ය පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක්,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණු සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසි වල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. *විභාග ක්‍රමය :* විභාග මාධ්‍යය

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා වලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රජයේ සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබාගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණ සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

සටහන : (i) අපේක්ෂකයෙකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii) ඉල්ලුම්පතෙහි සඳහන් විභාග භාෂාව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය :*

(අ) පහත සඳහන් විෂයයන් ගැන ලිඛිත පත්‍රවලින් සමන්විත පරීක්ෂණයක්.

සාමාන්‍ය පරිපාලනය - ලකුණු 100 - කාලය පැය 03 යි
මුදල් රෙගුලාසි - ලකුණු 100 - කාලය පැය 03 යි
විෂයානුබද්ධ අධ්‍යයනය - ලකුණු 100 - කාලය පැය 02 යි

(ආ) වාචික පරීක්ෂණය : ලකුණු 25 කි.

ලිඛිත පරීක්ෂණයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරෙන් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගත්තා වූ ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ ද, අපේක්ෂකයන් පමණක් වාචික පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛාවක් සිටීනම්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ලකුණු ලබාදීමේ ක්‍රමය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ අනුමත කරනු ලැබේ.

සටහන : වාචික පරීක්ෂණය සඳහා කැඳවීම පත්වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ. සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි වේ.

එක් වරක දී පත් කරනු ලබන සංඛ්‍යා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ.

14. *විෂයය නිර්දේශය* :

(අ) *සාමාන්‍ය පරිපාලනය* :

පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහයේ විධිවිධාන, කාර්යාල පරිචය හා කාර්යාල ක්‍රම සහ තත්කාලීනව භාවිතා වන චක්‍රලේඛ උපදෙස් පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

(ආ) *මුදල් රෙගුලාසි* :

(i) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 1 කොටස (x පරිච්ඡේදය හැර)

(ii) ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු - ඒවා පිළියෙළ කිරීම ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජනය

(iii) කච්චේරිවලට අදාළ වන විශේෂිත ගිණුම්වලට අදාළ ආඥා පනත්

(ඇ) *විෂයානුබද්ධ අධ්‍යයනය* :

අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරුණු ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂකයා විසින් විසඳුම් ලබා දෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනඟන ලද ගැටළු ඔහුට යොමු කරනු ඇත.

මෙම විභාගය සඳහා අයදුම්කරන හෝ අයදුම්කරන ලද අපේක්ෂකයන්ගේ සුදුසුකම් පිළිබඳ සීමා හෝ මෙම ගැසට් නිවේදනයේ වෙනත් ඇපැහැදිලි කොටස් පිළිබඳ තීරණයක් ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය -2007

Limited Competitive Examination for Recruitement to the Sri Lanka Administrative Service Grade III

ඉල්ලුම්පත්‍රය

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(සිංහල - 2, දෙමළ -3, ඉංග්‍රීසි - 4)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 නගරය

| විභාගය පෙනී සිටීමට අපේක්ෂිත නගරය |
|---|
| |

| එම නගර අංකය |
|---|
| |

(විභාග නිවේදනයේ 1 වන ඡේදයට අනුව
නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

3.0 පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

උදාහරණ SILVA, A. B.

3.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 කාර්යාලීය ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

3.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.7 ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ -0, ස්ත්‍රී - 1) [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න

3.8 විවාහක/අවිවාහක බව : (අවිවාහක 1, විවාහක -02)

අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

3.9 ජනවර්ගය : (සිංහල 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් -4, වෙනත් 5)

අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

3.10 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.11 උපන් දිනය :

වර්ෂය ☐ මාසය ☐ දිනය ☐

4.0 ඔබ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/වාචික පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :——————.

5.0 (i) *ගැසට් නිවේදනයේ 5 වන ඡේදයේ සඳහන් සේවා දෙපාර්තමේන්තු ශ්‍රේණි වලින් ඔබේ සේවාව/ශ්‍රේණිය (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් (ඇත්නම්) එය සඳහන් කළ යුතුය.*

සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි එකකට වැඩි ගණනක ඔබ සේවය කර ඇත්නම්, එම සේවාවන් හා ශ්‍රේණින් දිනයන් සහිතව සඳහන් කළ යුතුය)

(*අ*) දැනට දරන තනතුර :—————.
තනතුර අයත් සේවය (රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය)
ශ්‍රේණිය :—————.
පන්තිය/බණ්ඩය :—————.
තනතුරට පත් වූ දිනය :—————.
උපාධිය ලැබූ දිනය :—————.

(*ආ*) සුදුසුකම් ලබාදෙන අනෙකුත් සේවාවන්/ශ්‍රේණින් (ඇත්නම්)

| *සේවය/ශ්‍රේණිය නම* | *පත් වූදිනය* | *ස්ථිර කළ දිනය* | *සේවා කාලය … …දින සිට …දක්වා* |
|---|---|---|---|
| (1) ………… | ………… | ………… | ………… |
| (2) ………… | ………… | ………… | ………… |
| (3) ………… | ………… | ………… | ………… |
| (4) ………… | ………… | ………… | ………… |
| (5) ………… | ………… | ………… | ………… |

(ii) *ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ සඳහන් කර ඇති* සේවාවන්/ශ්‍රේණිවල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ස්ථිර සහ අඛණ්ඩ මුලු සේවා කාලය :—————.

6.0 (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිති තරඟ විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) —————. (iv) —————.
(ii) —————. (v) —————.
(iii) —————. (vi) —————.

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන, විවෘත තරඟ විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) —————.
(ii) —————.
(iii) —————.

7.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :

(ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න. ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

8.0 අයදුම්කරුගේ සහතිකය :

……………………දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතානාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට මා සුදුසුස්කු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ………… හා ……… වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

—————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (පෞද්ගලික ලිපිගොනුවට අනුව)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන.... මයා/මිය/මෙනවිය ... වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලසීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතානධික සියල්ලම උපයාගෙන ඇති බවද, එම කාලසීමාව තුල කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු භාජනය නොවූ බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් නිවැරදි යයි සොයාගෙන ඇති බව ද, අදාළ *ගැසට්* නිවේදනයන්හි සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී, මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාව යොදන්න)

12-585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.